| |
|---|
| **ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය** |
| **දෙවන වාර පරීක්ෂණය - 2018** |
| **10 ශ්‍රේණිය** **සිංහල සාහිත්‍ය රසාස්වාදය** |

**නම :** ........................................................................................................................

**I කොටසෙහි 1, 2 ප්‍රශ්නවලටත් II කොටසෙහි 3 වැනි ප්‍රශ්නයටත් III කොටසෙහි 4, 5, 6, 7 ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සපයන්න.**

**I කොටස**

1) (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා ඒවා ඇසුරින් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

i) 'නුවණැති තැනැත්තන් පළමුව ලබන්නා කැමැත්තෙමි .'

(අ) මෙසේ ප්‍රකාශ කළේ කවුරුන් ද?
(ආ) මෙම ප්‍රකාශය කළේ කුමන අවස්ථාවකදී ද?

ii) 'ඩිංගිරිගෙන් බත් ඉල්ලාගෙන කාලා නිදාගන්න'

(අ) මෙම ප්‍රකාශය කළේ කා හට ද?
(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩම උපුටා ගත් ග්‍රන්ථය කුමක් ද?

iii) රුදුරු ගිනි කඳක් ගත් සඳෙහි     වනතුරු
මිතුරු වේය දිගතින් හමන     මදමරු

(අ) කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
(ආ) මෙම පද්‍ය ඇතුළත් ග්‍රන්ථය රචනා වූ යුගය සඳහන් කරන්න.

iv) 'දැං ඉතිං කෑම ටිකක් කාලම හිටිමු.'

(අ) මෙම ප්‍රකාශය කළේ කවුද?
(ආ) මෙම උද්ධෘතය ඇතුලත් ග්‍රන්ථයේ රචකයා කවුරුන්ද?

v) ලස්සන හිමවතේ මා වී     පැසෙන්නේ
දුක් දෙන අලි ඇතුන් පන්නා     හරින්නේ

(අ) මෙහි ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
(ආ) මෙම කවියා ජිවිතයේ මුහුණ දෙන දුෂ්කරතා 02 ක් සඳහන් කරන්න.

(ල. 4 x 5 = 20)

2) පහත දැක්වෙන ගද්‍ය කොටස කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

'මෙතැන් පටන් තොපගේ අතවැස්සා ලවා මටත් මාගේ දරුවන්ටත් බත් මාළු පිස මා දරුවන්ට ඔහු විසින් ගෙනදෙන්ට කියව. තෝ අපට ගෙනෙව'. යි නියෝග කළේය. අරක්කැමි ගොස් බෝධිසත්වයන්ට කීයේ ය. එබස්

අසා බෝධිසත්වයෝ 'දැන් මාගේ මනෝරථය මස්තකප්‍රාප්ත ව ගියේ ය.' යි සතුටුව 'මෙතැන් පටන් ප්‍රභාවතින් දකිමි' සිතා ඕ හට රන් දහස දී දෙවන දවස් බත් මාළු පිස රජ්ජුරුවන්ට දී අරක්කැමියා අත යවා රාජ කුමාරිකාවන්ට ගෙනයන වසුන් කඳ තුමු හැරගෙන ගොස් ප්‍රභාවතීන්ගේ මාළිගාවට නැංගහු ය.එසඳ ප්‍රභාවතීන් වසුන් කඳ ගෙනෙන බෝධිසත්වයන් දැක මුන් වහන්සේ තමන් වහන්සේට නුසුදුසු වූ වහල් කළමනා දෙය කරන සේක. ඉදින් මම දවස් ගණනක් බැණ නොනැඟී උනිම් නම් මාමු කැමැත්තෝ වනැයි සිතා අන් තැනකට ගොස් මා දැක දැක මෙහි වාසය කරන සේක. එසේ නොකොට මෙහි ඇසිල්ලකුත් නොරඳා යන සැටියේ බැණ දොඩා නික්මවමි දොර අඩවල කොට ගෙන ගොස් එක් අතකින් දොර අල්වාගෙන අඟුලු කණුවේ වැතිර සිට

'කුස රජ්ජුරුවන් වහන්ස, මෙබඳු වූ කාරියක් ඉදින් පිවිතය සේ නමුත් නොකරන සේක. එතකුදු වුවත් මා නිසා උදාසනය, සවසය, මධ්‍යම රාත්‍රිය, මධ්‍යහනය යන විභාගයක් නැතිව දිය දර සැපයීම් පිසීම් කැවීම් පෙවීම් ආදී හින ක්‍රියාවෙන් හා දුර්භෝජන දුක්ඛ සෙය්‍යාවෙන් දවස් යවමින් මෙහි සිට දුක් නොවිඳ නුඹ වහන්සේ කුසාවතී නුවරට නැඟී ගොස් මා කෙරෙහි සිතිවිල්ලක් නොසිතා නුඹ වහන්සේ වැනි සකුරු පුවක් සේ දාහැලි ගිය මුහුණ ඇති යකින්නක අග මෙහෙසුන් කොට ගෙන රාජ්‍ය කළ මැනවි. ඉදින් විරූප වූ නුඹ වහන්සේ කෙතෙක් කල් මී ඉඳ දුක් උණත් මම නොකැත්තෙමි. නොරඳා වහා නික්මුණු මැනවැයි කිවුය. එකල්හි මහා බෝධිසත්වයෝ ප්‍රභාවතින්ගෙන් මෙච්චර කථා සම්භාෂණයක් ලදිමි යි ද තුටුව මුවපොල්ලන්ට බඳු වූ ඇස් ඇති හේමාකරණ විභූෂිත ගාත්‍රා මාතා වූ කටී ප්‍රදේශ ඇති රන්කමින් විසිතුරු වූ වස්ත්‍රයෙන් ශෝභමාන වූ දේහ ඇති ප්‍රභාවතිනි තොපගේ රූප සෞන්දර්යයෙන් පැහැර ගන්නා ලද සිත් ඇති ක්ලේශාන්ධකාරයෙන් වසන ලදුව දික් විභාගයෙහි අසමර්ථ හෙයින් කුසාවතී නම් රාජධානියට යා නොඑමි ඒ රාජශ්‍රීයෙන් මට ප්‍රයෝජන නැත්තේය. මෙරටම වාසය කරමි' කීහ.

i) මෙම උද්ධෘතය ඇසුරෙන් කුස ජාතක කතාකරු අවස්ථා හා සිද්ධි ප්‍රබල ලෙස ඉදිරිපත් කිරීමට සමත් වී ඇති බව නිදසුන් 02 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 05)

ii) ඉහත කොටසේ ඇතුළත් උපමා 02 ක් උපුටා දක්වන්න. (ල. 05)

iii) මෙම සිදුවීමේදී ප්‍රභාවතී ක්‍රියා කරන ආකාරය ජාතක කතාකරු පෙන්වා දී ඇත්තේ කෙසේ ද? (ල. 05)

iv) මෙම උද්ධෘතය ඇසුරින් කුස රජුගේ චරිත ලක්ෂණ කෙබඳු ආකාරයට ඉස්මතු කර තිබේ ද යන්න විමසුමට ලක් කරන්න. (ල. 05)

## II කොටස

3) පහත පැදි පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අමිත ගුණ නුවණ යුතු උතුමෝ　　පබඳ
අනත වෙහෙස ලදුවත් නොම වෙති　　දුහද
දිගත පතළ සුවඳැති සොඳ සඳුන්　　කඳ
සිඳිත මඬිත එක ලෙස පැතිරෙයි　　සුවඳ

කොතෙක් ගුණ කළත් දුදනන් හට　　අසුබ
අකක් පමණවත් නොම කෙරෙහි　　පිළිලබ
එළක් රසෙහි සැදුවත් නිඹ බිජු　　කිරඹ
උදක් තිත්මය පසඟම තුරෙහි　　නිඹ

කුරිරු ගොර සපුන්ගේ දළගෙහි　　විසය
මදුරු මැසි කැලන්ගේ තුඹ ගෙහි　　විසය
රුදුරු නුහුසුවන්ගේ වල ගෙහි　　විසය
නපුරු දුදනන්ගේ සියලගෙහි ම　　විසය

i) ඉහත පැදි පෙළෙහි රචකයාගේ අරමුණ වී ඇත්තේ කුමක්දැයි පැහැදිලි කරන්න. (ල. 05)

ii) මෙම පැදිවලට අනුව සුදන හා දුදන ගති පෙන්වා දෙන අයුරු නිදසුන් 02 ක් මඟින් පැහැදිලි කරන්න.

(ල. 05)

iii) පහත සඳහන් පදවල අර්ථ දක්වන්න.

1. සිඳිත මඬිත 2. අමිත 3. නුහුසුවන්ගේ 4. කිරඹ 5. පිළිලබ

iv) මෙහි ඇතුළත් උපදේශ පැහැදිලි කිරීම සඳහා ස්වභාවික පරිසරය හා බැඳුණු සිද්ධි හා සත්ව චරිත යොදා ගෙන ඇති අයුරු සාකච්ඡා කරන්න. (ල. 10)

## III කොටස

**මෙම කොටසේ ප්‍රශ්න 02 කට පමණක් පිළිතුරු සපයන්න. (එක් පිළිතුරක වචන 100 ක්වත් තිබිය යුතුය)**

4) කුස ජාතකය පාඨක ශ්‍රාවක සිත්තුල හාස්‍ය හා උපහාසය මතු කරන අයුරින් රචනා වී ඇති අයුරු නිදසුන් 03 ක් වත් යොදා ගනිමින් පැහැදිලි කරන්න.

(ල. 15)

5) ගැමියන්ගේ චර්යා හා සිතුම් පැතුම් සිත් ගන්නා අයුරින් ඉදිරිපත් කිරීමට තුංමං හන්දිය කතුවරයා දරා ඇති උත්සහාය නිදසුන් 03 ක් ඇසුරින් විමසන්න.

(ල. 15)

6) අව්‍යාජ ගැමි සිතුම් පැතුම් හා ජීවන වෘත්තීන් පිළිබඳව අපූර්වත්වයෙන් කියාපෑමෙහි ලා ජන කවියා දැක්වූ කුසලතාව උදාහරණ 03 ක් දෙමින් පැහැදිලි කරන්න.

(ල. 15)

7) ළමා සිතුවිලි හා ළමා මනස ක්‍රියාකරන අන්දම ‘වෙසක් පහන’ කෙටි කථාවෙන් මනාව නිරූපණය වේ. නිදසුන් දක්වමින් මෙම අදහස විමසන්න.

(ල. 15)